# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2454/02 – 2025 සැප්තැම්බර් මස 15 වැනි සඳුදා – 2025.09.15**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

### දකුණු පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ බලතල පැවරීමේ නියෝග

දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 2.(4) වගන්තියෙන් දකුණු පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල එකී පළාත් සභාව විසුරුවා හැර ඇති හෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඇ. ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති හෙයින් එකී බලතල ප්‍රකාරව දකුණු පළාත් ආණ්ඩුකාරවර මද්දුම කංකානමලාගේ බන්දුල හරිස්චන්ද්‍ර වන මම, දකුණු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාට සහය වීම සඳහා පත්කර ඇත්තා වූ පහත දක්වා ඇති උපලේඛනයෙහි I වැනි තීරුවේ සඳහන් අය වෙත දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය හා ඒ යටතේ පනවා ඇති රීති ප්‍රකාරව සමුපකාර සමිති කොමසාරිස් රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇත්තා වූ එකී උපලේඛනයේ III වැනි තීරුවේ සඳහන් සියළුම බලතල හා උක්ත සමුපකාර සමිති ප්‍රඥප්තියේ පූර්විකාව සමඟ කියවෙන 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ (සංශෝධිත) අනනුකූල නොකරන ලද III වැනි තීරුවේ සඳහන් සියළුම බලතල එකී උපලේඛනයේ II වන තීරුවේ සඳහන් දින සිට මෙයින් පවරමි.

**මද්දුම කංකානමලාගේ බන්දුල හරිස්චන්ද්‍ර,**
ආණ්ඩුකාරවර,
දකුණු පළාත.

2025 ක් වූ අගෝස්තු මස 29 වැනි දින,
ගාල්ල,
දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

I වැනි උපලේඛනය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| ගම්මැද්දේගොඩ ලියනගේ රුවිනි සෞම්‍යා කරුණාතිලක මිය. (නියෝජ්‍ය කොමසාරිස්) | 2025.05.29 | දකුණු පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 3,4[4.(3)හැර],5,6,7,8,9,28,37,39[39.(10)හැර],40,41,43,44, 45,46,48,53.(1),53.(2)(ආ),54,56.(1),66,70 හා 73 යන වගන්ති යටතේ කොමසාරිස්වරයා සතු සියලු බලතල<br><br>රීති මාලාවේ 03,10,14,15,17,18,19,26, 31,32,34,36,38,39,40,44 (44.(x)(xii)(xiii)(xiv)හැර),46,47 සහ 48 දරන රීති යටතේ කොමසාරිස්වරයා යටතේ පවතින සියළුම බලතල<br><br>දකුණු පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ පූර්විකාව සමඟ කියවෙන 1989 අංක 12 දරන පළාත් සභා අනුශාංගික විධිවිධාන පනත අනුව 1983 අංක 32 හා 1992 අංක 11 දරන පනත් වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ අනනුකූල නොකරන ලද 9(4), 9(5), 44(2)(1)(අ), 53(2), 58(1)(ඉ) වගන්තිවලින් කොමසාරිස්වරයා යටතේ පවතින සියළුම බලතල |

EOG 09-0123

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.